U.R.
DE SILVA
PRESIDENT'S COUNSEL

**No. 61/9,**
Manel Mawatha, Old Kesbewa Road,
Gangodawila,Nugegoda, Sri Lanka.
**T**: +94 112 823 728 / +94 112 768 748
**M** : +94 777 764 521 | **E** : udaya.desilva10@gmail.com

ප්‍රසාද් රණසිංහ මහතා,
අධ්‍යක්ෂක,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.
25.12.2023

අධ්‍යක්ෂකතුමනි,

**මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 42158/23 දරණ නඩුවට අදාළ මුල් පැමිණිල්ල සම්බන්ධවයි.**

මාගේ සේවාදායක කෙහෙලිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය ඇමතිතුමාගේ උපදෙස් පරිදි එතුමාගේ උපදේශක ආචාර්ය සංජය පෙරේරා විසින් ඔබ දෙපාර්තමේන්තුවට කරන ලද 2023.10.02 දිනැති ලිඛිත දැනුම් දීම මත 2023.10.11 වන දින පැමිණිල්ලක් සටහන් කර ගැනීමෙන් පසු පරීක්ෂණ ආරම්භ කර ඉහත අංක 42158/23 දරණ නඩුව පවරා ඇති බව පෙනීයයි.

මුලින් කරන ලද පැමිණිල්ලට අදාළව පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යාමේ දී හිටපු අමාත්‍යතුමාගේ සහාය එකී පරීක්ෂණ සඳහා අවශ්‍ය බව මා හට පෙනී යාම නිසා මාගේ සේවාදායකගේ උපදෙස් පරිදි මෙම ලිපිය ඔබ වෙත එවීමට පියවර ගනිමි.

මෙම සිද්ධියට අදාළ ප්‍රධාන සැකකරු සුදත් ජානක ප්‍රනාන්දු යන අය ප්‍රශ්නගත ඖෂධය හදිසි මිලදී ගැනීමක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සාමාන්‍ය ප්‍රසම්පාදක ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගැනීමට ක්‍රියා කිරීමේදී ව්‍යාජ ලෙස කටයුතු කළ ආකාරය ගැන මාගේ සේවාදායක විසින් පුළුල්ව සොයා බැලීමක් කර ඇති අතර ඒ පිළිබඳව විස්තර ඇතුළත් වැඩිදුර කටඋත්තරයක් ලබා ගැනීමට පියවර ගන්නේ නම් එසේ ලබාදීමට හැකියාව තිබේ.

පළමු සැකකරු විසින් ප්‍රශ්නගත ඖෂධය මෙරටදී නිශ්පාදනය කර ව්‍යාජ ලෙස ඉන්දියානු බෙහෙත් සමාගමකින් නිශ්පාදනය කළ බවට පෙන්වාදී තිබීම සම්බන්ධයෙන් මාගේ සේවාදායක තොරතුරු විමසීමෙන් පසු ඔවුන් විසින්ද අදාළ වංචනික ක්‍රියාව තහවුරු කර තිබීම ඔබ පරීක්ෂණයට වැදගත් වේ යැයි සිතමි.

ඊට අමතරව,

- අනෙකුත් සැකකරුවන් ගෙන්වා මෙම සිද්ධිය සම්බන්ධව ප්‍රශ්න කිරීමට අදාළ රැස්වීමේ වීඩියෝ පටය;
- අදාළ ආයතන වලින් 1 වන සැකකරු සම්බන්ධව තොරතුරු විමසා බලා තිබීම සම්බන්ධ ලිපි;
- වංචනික ක්‍රියාවලිය දැනගත් වහාම ගෙවීම් ඉදිරියට කිරීම නැවැත්වීම;
- ඔහුට ලබා දීමට තීරණය කර තිබූ වෙනත් ඇනවුම් අවලංගු කිරීමට අදාළ ලේඛන;

සම්බන්ධ තොරතුරු සියල්ල ඔබ ආයතනය මගින් පවත්වනු ලබන පරීක්ෂණයට උපකාරී වේයැයි සිතමි.

නිලධාරීන්ගේ නොසැලකිලිමත් ක්‍රියාව සම්බන්ධව දෝෂාරෝපණ කිරීමට අදාළව මෙම පළමු සැකකරු තර්ජනාත්මක ඊමේල් පණිවිඩයක් එවා තිබේ. පළමු සැකකරුගේ පසු හැසිරීම ඔහු විසින් මාගේ සේවාදායකට තර්ජනය කර එවූ ඊමේල් පණිවිඩය මගින් තහවුරු වී ඇත. එයද ඉදිරිපත් කිරීමට මාගේ සේවාදායක සූදානමින් සිටී.

ඇතිවූ තත්ත්වය පිළිබඳව මාගේ සේවාදායක විසින් නීතිපතිතුමා දැනුවත් කර එතුමාගේ සහාය ඉල්ලා තිබෙන බවද මෙයින් දැනුම් දෙමි.

ඉහත කරුණුවලට අමතරව පරීක්ෂණය සාර්ථකව කරගෙන යාමට අවශ්‍යය වෙතැයි සිතනු ලබන මාගේ සේවාදායක සතුව තිබෙන ඕනෑම ලේඛනයක් ලබාදීමට සූදානම් බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

ඔබගේ නිලධාරියකුට අවශ්‍ය වේලාව කලින් දැනුම් දීම කරනු ලබන්නේ නම් කෘතඥ වෙමි.

ස්තුතියි !

මෙයට,